# කෞශල්‍යයන් හා බටහිර ජාතීහු

කෞශල්‍යයන්ගේ මරණය පිළිබඳ ව වඩාත්ම කලබලයට පත් වී ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානය ය. එහි ලේකම් කොෆී අන්නන් මහතා කෞශල්‍යයන් මැරීම හෙළාදකිමින් නිවේදනයක් නිකුත්කිරීමෙන් නොනැවතී කෞශල්‍යයන්ගේ පවුලේ අයට ශෝක පණිවුඩයක් ද එවීමට තරම් කම්පා වී ඇත. අන්නන් මහතා කෞශල්‍යයන් පෞද්ගලික ව හැඳිනගෙන සිටි බවට ආරංචියක් නැත. ඔහුට මේ මිනීමැරුම ගැන කියන්නට ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොළඹ පිහිටි කාර්යාලයේ සේවයකරන්නන් යැයි සිතීමට බොහෝ දුරට ඉඩ ඇත. එසේත් නැත්නම් එක්සත් ජාතීන්ගෙන් පඩි ලබන මෙරට සිටින විවිධ උපදේශකයන්ගෙන් කෙනකු ඒ බව දැන්වුවා විය හැකි ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ උපදේශක නමින් ඔත්තුකාරයන් ද සේවයකරන බව රහසක් නො වෙයි. මේ සංවිධානය බොහෝ දුරටර ක්‍රියාත්මකවන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ බළල් අතක් ලෙස ය. ඇමරිකන් ඔත්තුකාරයෝ මේ සංවිධානය හරහා ඇතැම්විට ක්‍රියාත්මක වෙති. මේ ඊනියා උපදේශකයෝ ඇතැම්විට සිංහල බෞද්ධ සංවිධානවලට ද රිංගාගෙන සිටිති. ඉන් ඇතැමකුට කතෝලික ජාත්‍යන්තර සංවිධානවල සම්මන්ත්‍රණ අමතා කතෝලික පල්ලියට විරුද්ධව කතාකිරීමට හැකි බව ඒ පුද්ගලයෝම පවසති!

කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ  කොළඹ හා නිව්යෝර්ක්හි පිහිටි කාර්යාල දෙමළ ජාතිවාදය වෙනුවෙන් ක්‍රියාකරන බව මෑතක සිට එළිපිටම දැකිය හැකි ය. කොෆී අන්නන් මහතා සුනාමි විපත් බැලීම සඳහා ලංකාවට පැමිණි අවස්ථාවෙහි ඔහු උතුරෙහි හා නැගෙනහිර කරන සංචාරයක මුවාවෙන් කොටි සංවිධානයේ නායකයන් මුණගැස්සවීමට උත්සාහයක් තිබිණි. ඒ වෑයම අසාර්ථක වුයේ මෙරට විදේශ අමාත්‍යාංශයේ යම් දේශප්‍රේමී නිලධාරියකුගේ හෝ නිලධාරීන් කිහිපදෙනකුගේ හෝ ක්‍රියාත්මකවීම හේතුවෙන් ය. එසේ කොෆී අන්නන් මහතාට කොටි නායකයන් හමුවීමට අවස්ථාව නොලැබීම පිළිබඳ ව පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොළඹ කාර්යාලයේ සේවයකරන්නෝ මැසිවිලි නැගූහ. ඔවුන් ක්‍රියාකරන්නේ කාගේ වුවමනාවට ද යන්න තවත් හෙළිදරවු වුයේ කොෆී අන්නන් මහතාට ඊනියා දෙමළ සහන සංවිධානයේ (ටීආර්ඕ) නියෝජිතයන් පිරිසක් මුණගැස්සවීමෙන් ය. මේ දෙමළ සහන සංවිධානය  යනු කොටි සංවිධානයේ පෙරමුණු සංවිධානයක් (ෆ්‍රන්ට් ඕගනයිසේෂන්) පමණකි. කොෆී අන්නන් මහතා උතුරට හා නැගෙනහිරට නොයැවීම නිසා කොටි සංවිධානය ප්‍රචාරක වාසියක් ලබාගත්තේ යැයි එක්තරා ලේඛකයකු පසුගිය දා ප්‍රකාශකර තිබුණි. මේ ලේඛකයන් කියන ඇතැමුන්ගේ බුද්ධියේ තරම ඉන් හෙළි වෙයි. කොෆී අන්නන් මහතා කොටි සංවිධානයේ නායකයන් ලංකාවේ දී මුණගැසුණේ නම් කොටි ඉන් ලබාගන්නා වාසිය වර්තමාන සුබලාට හා යසලාට නොතේරීම පුදුමයක් නොවන්නේ ඔවුන්ට තවමත් අසුබ අයස කසිකබල් මාක්ස්වාදී දෘෂ්ටියෙන් ගැලවීමට නොහැකි වී ඇති බැවිණි.

ඒ කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා ඇමරිකන් එක්සත් ජනපදයේ ද්විත්ව රඟපෑම ගැන අප අවබෝධයක් ලැබිය යුතු ය. ඇමරිකන් එක්සත් ජනපදය තම රටේ කොටි සංවිධානය තහනම්කර ඇත්තේ ලංකාවේ ප්‍රශ්නයක් නිසා නොව කොටි ඇතැම් ආරාබි සංවිධාන සමග පවත්වන සම්බන්ධකම් හේතුකොටගෙන ය. මේ අරාබි සංවිධාන බොහෝමයක් ඇමරිකාවේ තහනම්කර ඇති ත්‍රස්තවාදී  සංවිධාන වෙයි. ඒ සංවිධාන ඇ. එ. ජනපදයට තර්ජනයක් වෙයි. ඒ සංවිධාන සමඟ සම්බන්ධකම් පවත්වන සංවිධාන ද එබැවින් එරට තහනම්කිරීමට සිදුවෙයි. එහෙත් ඇ. එ. ජනපදය නිල වශයෙන් කොටි සංවිධානය තහනම් කළ ද ඒ සංවිධානය සමග වක්‍ර මාර්ගවලින් සම්බන්ධකම් පවත්වයි. අප කවුරුත් දන්නා නෝර්වේ යනු ඇ. එ. ජනපදයේ අවශ්‍යතාවන් පෙනී සිටින රාජ්‍යයක් පමණකි.  ඒ හැරෙන්නට ඇ එ. ජනපදය අවශ්‍ය අවස්ථාවල දී එක්සත් ජාතීනගේ සංවිධානය ද උපයෝගී කරගනියි. ඔත්තුකාරයන් පත්කිරීමට මෙන් ම වෙනත් සම්බන්ධකම් පවත්වාගෙන යෑම සඳහා ද ඇ. එ. ජනපදයට එක්සත් ජාතීන්ගේ සංවිධානය අවශ්‍ය වෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කොළඹ කාර්යාලය කටයුතුකරන්නේ ඇ. එ. ජනපදයේ අවශ්‍යතාවට නොවේ යැයි කිව නො හැකි ය. තමන්ට දිරවාගත නොහැකි වු මාක්ස්වාදය ද අවසාන වශයෙන් සේවය කරන්නේ අධිරාජ්‍යවාදයට බව වත්මන් සුබලාට නොතේරීම පුදුමයක් නො වෙයි.

කෞශල්‍යයන් මැරුවේ තමන් බව කරුණා පාර්ශ්වය ප්‍රසිද්ධියේ පිළිගෙන ඇත. ඔහු මරණයට පත්වූයේ ඊනියා මුදාගත් ප්‍රදේශයක බැවින් ආණ්ඩුව ඒ පිළිබඳ වගකිවයුතු යැයි කීමට කොටි උත්සාහ කරති. මේ අතර ඇතැමුන්

© Prof. Nalin De Silva

උත්සාහකරන්නේ කෞශල්‍යයන් මරාදැමීමෙන් කරුණා පාර්ශ්වය ආණ්ඩුව අමාරුවට පත්කරඇති බව කීමට ය. ඊනියා මුදාගත් ප්‍රදේශයකදී කෞශල්‍යයන් මැරීමෙන් ආණ්ඩුවට එය අවාසි සහගත වන්නේ කෙසේ ද? කොටි සංවිධානය නීලන් තිරුචෙල්වම් මහතා මරා දැමුවේ කොළඹ හතේ දී ය. කොළඹ හත සැමදාමත් ආණ්ඩුවේ පාලනය යටතේ තිබුණි. එහෙත් තිරුචෙල්වම් මහතා මරාදැමීම පිළිබඳ ව ආණ්ඩුව වගකිවයුතු යැයි එදා කිසිවකු කියාසිටි බවක් දැනගන්නට නැත. එමෙන් ම ඒ හේතුවෙන් ආණ්ඩුවට ප්‍රශ්නයක් වූ බවක් ප්‍රකාශවූයේ ද නැත. එසේ නම් දැන් මේ වෙනත් කතාවක් කියන්නේ කුමක් නිසා ද? මෙහි තේරුම ආණ්ඩුව ලවා කරුණා පාර්ශ්වයට පහර දීම ද? එසේත් නැත්නම් ලංකාණ්ඩුවේ හමුදා සහ කරුණාගේ කොටි අතර ගැටුමක් ඇතිකිරීම ද? සියල්ල සිදුවන්නේ කාගේ අවශ්‍යතාව සඳහාදැයි දැනගැනීමට ජේන බැලීමට අවශ්‍ය නො වෙයි.

මෙහි දී තවත් කිවයුත්තක් ඇත. තිරුචෙල්වම් මහතා මරා දැමීමෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්වරයා කම්පනයට පත්වී ශෝක ප්‍රකාශ නිකුත්කෙළේ නැත. එමෙන් ම ඒ මරණය හෙළා දැක්කේ ද නැත. ප්‍රභාකරන් විසින් මහත්තයා මරාදමනු ලැබූ අවස්ථාවේ දී ද එක්සත් ජාතීන්ගේ සංවධානය නිහඬ විය. කොටි අහිංසක සිංහලයන් මරා දමද්දී ද කට සෙලෙවුවේ එහි ලේකම්වරයා නො වෙයි. එසේ නම් මේ අවස්ථාවේ දී පමණක් බටහිර ජාතීන් කම්පනයට පත්වී ඇත්තේ ඇයි? කෞශල්‍යයන්ගේ මරණය  කොටි සංවිධානයට තදබල පාඩුවක් බවත් ඒ සම්බන්ධයෙන් බටහිර ජාතීන් කැලඹී ඇති බවත් ඔවුන් ප්‍රශ්නයෙහි දී කෙලින්ම මැදිහත් නොවී එක්සත් ජාතීන්ගේ සංවිධානය යොදාගන්නා බවත් පැහැදිලිය.

කෞශල්‍යයන් නෝර්වේ විසින් සකස්කෙරී රනිල් වික්‍රමසිංහ මහතා සහ ප්‍රභාකරන් අත්සන්කළ ඊනියා සහයෝගිතා ගිවිසුම කඩා ඇති බව ද පැහැදිලි ය. ඊනියා සහයෝගිතා ගිවිසුම යනුවෙන් හැඳින්වෙන සිංහලයන් පාවාදීමේ ගිවිසුමට අනුව කොටි ඊනියා මුදානොගත් ප්‍රදේශ ඔස්සේ යෑමේ දී ඒ බව හමුදාවට දැනුම් දී අවසර ලබාගත යුතු ය. කෞශල්‍යයන් මියයන අවස්ථාවේ නිරායුධව සිටියේ යැයි කියැවෙයි. ඒ කෙසේ වෙතත් ඔහුගේ නිරුවත හෙළිවූයේ ඔහු අවසර නොගෙන ඒ ගමන ගිය බැවින් ය. කොටි තමන්ට අවශ්‍ය අන්දමට ඔවුන්ට වාසිසහගත ලෙස ඇති පාවාදීමේ ගිවිසුම ද කඩන බව රහසක් නො වෙයි. එහෙත් කෞශල්‍යයන්ගේ මරණය ගැන කතාකරන බටහිරයන්ට මේ කිසිවක් අවශ්‍ය නැත. ඔවුන්ට අවශ්‍ය කෞශල්‍යයන් මරා දැමීම ලෝකයාට කීම පමණකි.

කෞශල්‍යයන් සමග කොටි සංවිධානර පාර්ලිමේන්තු නියෝජිතයන් වූ දෙමළ ජාතික සංධානයේ හිටපු මන්ත්‍රීවරයකු වූ නේරු නමැත්තකු ද ගමන්කර මැරුම් කා ඇති බව හෙළි වී ඇත. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විරුද්ධත්වය පා තමන්ට ආරක්ෂාව නැතැයි කීමට දෙමළ ජාතික සංධානයේ කොටි මන්ත්‍රීවරු උත්සාහකළහ. එය වැඩිම වුවහොත් විහිළුවක් පමණක් විය. පළමුවෙන් ම හිටපු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දීම පිළිබඳ ප්‍රශ්නයක් පැන නො නගියි. අරක්ෂාව ලැබෙන්නේ මන්ත්‍රීවරුන්ට මිස හිටපු මන්ත්‍රීන්ට නො වෙයි. දෙවනුව මේ හිටපු මන්ත්‍රීවරයා ගමන්කර ඇත්තේ ඒ අවස්ථාවෙහි නිරායුධව සිටින්නට ඇති වුව ද ත්‍රස්තවාදියකු සමග ය. ත්‍රස්තවාදීන් සමග දෙමළ ජාතික සංධානයේ සාමාජිකයන්ට ඇති සම්බන්ධය මෙයින් හෙළිදරවු වෙයි. නේරුගේ මරණයෙන් දෙමළ ජාතික සංධානයේ ස්වරූපය නම් හෙළිදරවු වී ඇත.

මේ අතර කොටි සංවිධානය ඊනියා සාම සාකච්ඡා සඳහා කොන්දේසි පණවා ඇති බව ද වාර්තාවෙයි. එක් කොන්දේසියකට අනුව උතුරු හා නැගෙනහිර පළාතවවල ආයුධ සන්නද්ධ කණ්ඩායම් සියල්ල නිරායුධකළ යුතුවෙයි. එසේ නම් පළමුවෙන් නිරායුධකළ යුතුවන්නේ කොටි සංවිධානය ය. මේ කොන්දේසිය ඉදිරිපත්කිරීමෙන් කොටි බලාපොරොත්තුවන්නේ ආයුධ දැරීමට තමන්ට අයිතියක් ඇතිබව නීත්‍යානුකූලව පිළිගැන්වීම ය. කරුණා කණ්ඩායම පමණක් නොව ඇතැම්විට ඊපීඩීපී සාමාජිකයන් ද නිරායුධකිරීම මෙහි එකම අරමුණ නො වෙයි. රටක ආයුධ දැරීමට නීත්‍යානුකූලව අයිතියක් ඇත්තේ ආණ්ඩුවට ය. කොටි මේ බලාපොරොත්තුවන්නේ තමන් ආණ්ඩුවක් බව පිළිගැන්වීම ය. මේ සඳහා සිංහල විරෝධී බටහිරයන්ගේ ද ආධාරය කොටින්ට ලැබෙයි. නෝර්වේ හරහා ක්‍රියාත්මකවන්නේ බටහිරයන්ගේ අවශ්‍යතාවය ය. කොටි හා ආණ්ඩුව එක්ව උතුරු හා නැගෙනහිර පළාත්වල කටයුතු කළ බවට ද ඔවුන් කියන්නේ ඒ සඳහා ය.  ආණ්ඩුව රනිල් වික්‍රමසිංහ අනුගමනයකරමින් බටහිර-කොටි කොන්දේසිවලට එකඟ වේවි ද?

© Prof. Nalin De Silva